**අධිකරණ අමාත්‍යාංශයෙහි ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණය (සිතාසි බෙදන්නා හා ඇස්කීසි ක්‍රියාත්මක කරන්නා/අධිකරණ සෝෂක හා ප්‍රවේශක) සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය - පළමුවන සංශෝධනය.**

**සංශෝධන ලැයිස්තු කෙටුම්පත**

| අනු අංකය | විෂය | සංශෝධනය විය යුතු ආකාරය |
|---|---|---|
| 1. | 1.6 | යොමු අංකය : PSC/EST/06-01-32/01/2016 දිනය : 2016.07.26<br>පළමු සංශෝධිත දිනය : 2024.06.10 |
| 2. | 7.3.2.2 වෘත්තීය සුදුසුකම් | "අදාළ නොවේ" යනුවෙන් ඇතුළත් කරන්න. |
| 3. | 7.3.2.3 පළපුරුද්ද | **සිතාසි බෙදන්නා හා ඇස්කීසි ක්‍රියාත්මක කරන්නා තනතුර සඳහා :**<br>I. සංචාරක අධිකරණ ආරක්ෂක, අධිකරණ ආරක්ෂක, පිස්කල් පියන්, කම්කරු තනතුරක හෝ කම්කරු විනිශ්චය අධිකාරයක ආරක්ෂක තනතුරක හෝ මුරකරු තනතුරක ස්ථිර කර තිබීම.<br>හෝ<br>II. කාර්යාල සේවක සේවයේ වසර 10ක සේවා කාලයක් සපුරා තිබීම, තනතුරේ ස්ථිර කර තිබීම සහ අධිකරණ අමාත්‍යාංශයේ හෝ ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුවක, කම්කරු විනිශ්චය අධිකාරයක හෝ අධිකරණයක හෝ/හා දැන්වීම ප්‍රසිද්ධ කරන දිනට වසර 02ක සේවයක් සම්පූර්ණ කර තිබීම.<br><br>**අධිකරණ සෝෂක හා ප්‍රවේශක තනතුර සඳහා :**<br>I. සංචාරක අධිකරණ ආරක්ෂක, අධිකරණ ආරක්ෂක, පිස්කල් පියන්, කම්කරු තනතුරක හෝ කම්කරු විනිශ්චය අධිකාරයක ආරක්ෂක තනතුරක හෝ මුරකරු තනතුරක ස්ථිර කර තිබීම.<br>හෝ<br>II. කාර්යාල සේවක සේවයේ වසර 10ක සේවා කාලයක් සපුරා තිබීම, තනතුරේ ස්ථිර කර තිබීම සහ අධිකරණ අමාත්‍යාංශයේ හෝ ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුවක, කම්කරු විනිශ්චය අධිකාරයක හෝ අධිකරණයක හෝ/හා දැන්වීම ප්‍රසිද්ධ කරන දිනට වසර 02ක සේවයක් සම්පූර්ණ කර තිබීම.<br>III. පිස්කල් භාරකාර මාතා තනතුරේ වසර 10ක සේවා කාලයක් සපුරා තිබීම හා තනතුරේ ස්ථිර කර තිබීම. |
| 4. | 7.3.4.4 හි සටහන් අංක 2 | සටහන :<br>2. ලිඛිත විභාගයෙන් ඉහළම සමත් ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ලිඛිත පරීක්ෂණය හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය යන දෙකෙන්ම ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතරින් කුසලතා අනුපිළිවෙළ අනුව **පළමුව සිතාසි බෙදන්නා හා ඇස්කීසි ක්‍රියාත්මක කරන්නා තනතුරටත්, ඉන් පසුව අධිකරණ සෝෂක** හා ප්‍රවේශක තනතුරටත් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ. |

<table>
<tr><td>5.</td><td>7.3.2.5</td><td>මෙහි සඳහන් අංක IV පහත පරිදි සංශෝධනය කරන්න.<br>IV . රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා ඊට ආනුශංගික චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.<br>මෙහි අංක V සහ VI කොටස් ඉවත් කරන්න.</td></tr>
<tr><td>6.</td><td>9.1</td><td>වගුවෙහි අනෙක් රාජ්‍ය භාෂාව සඳහා ලබා ගත යුතු ප්‍රවීණතාව යටතේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 වෙනුවට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 ලෙස සඳහන් කරන්න.
<table>
<tr><td>භාෂාව</td><td>ලබා ගත යුතු ප්‍රවීණතාව</td></tr>
<tr><td>01. රාජ්‍ය භාෂාව</td><td>රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුනු නිලධරයින් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතුය.</td></tr>
<tr><td>02. අනෙක් රාජ්‍ය භාෂාව</td><td>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාව ලබා ගත යුතුය.</td></tr>
</table></td></tr>
<tr><td>7.</td><td>10.1.1.1 හි අනු අංක iv</td><td>(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.</td></tr>
<tr><td>8.</td><td>10.2.1.1 හි අනු අංක ii</td><td>(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.</td></tr>
<tr><td>9.</td><td>10.3.1.1 හි අනු අංක ii</td><td>(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.</td></tr>
<tr><td>10.</td><td>13</td><td>සක්‍රිය සේවා කාලය අර්ථ නිරූපණය ඉවත් විය යුතු අතර, ඒ වෙනුවට ‘අදාළ නොවේ’ ලෙස සඳහන් කරන්න.</td></tr>
<tr><td>11.</td><td>15</td><td>සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 හා 2022.12.14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.</td></tr>
</table>